# මේ කුමන්ත්‍රණයක් නොවේ

බ්‍රිතාන්‍ය විදේශ ඇමති ඩේවිඩ් මිලිබෑන්ඩ් බදාදා ලංඩනයේ දී වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ දී ඊනියා ලෝක දෙමළ සංසදය අමතා කතාකර ඇත. ඊනියා ලෝක දෙමළ සංසදය නියෝජනය කරමින් රටවල් දහහතරකින් නියෝජිතයන් පැමිණි බව වාර්තා වෙයි. ඩේවිඩ් මිලිබෑන්ඩ් මේ ව්‍යාජ සංසද නියෝජිතයන් අමතා කියා ඇත්තේ ලංකාවේ ඊනියා සිවිල් යුද්ධය අවසන් වී ඇති නමුත් ඊනියා සිවිල් සාමය තවමත් ළඟා වී නොමැති බව ය. ඔහු තම සුපුරුදු බයිලා නැවත නැවතත් කියමින් ව්‍යාජ සංසදය සනසා ඇත්තේ බ්‍රිතාන්‍ය ඊනියා විශ්ව මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින බවත් එහෙත් ලංකාවේ කටයුතුවලට ඇඟිලි නොගසන බවත් කියමිනි. ඒ අතර ජී එස් පී බදු සහනය ඉවත්කිරීමට යුරෝපා සංගමය ගත් තීරණය අනුමත කරමින් ඔහු කියා ඇත්තේ ජී එස් පී වැඩසටහන ඊනියා සාරධර්ම හදවතින් ම අගය කරන බවත් මේ සාරධර්ම සිවිල් හා දේශපාලන සාරධර්ම බවත් ලංකාවේ හිංසාව හා දූෂණ ආදිය ගැන යුරෝපීයයන් සැළකිල්ලක් දක්වන බැවින් බදු සහනය ඉවත් කරගැනීමට සිදු වූ බවත් ය.

ඔහු තම කතාවේ දී ජනාධිපතිවරණයේ ඊනියා දූෂණ ගැනත් ඊනියා විපක්ෂ අපේක්ෂයා අත් අඩංගුවට ගැනීම ගැනත් සඳහන්කර ඇත. මෙරට හිටපු ඇමරිකන් තානාපතිවරයකු වූ බ්ලේක් මෙන් ම මිලිබෑන්ඩ් ද පවසා ඇත්තේ ඊනියා විපක්ෂ අපේක්ෂයාට ලංකාවේ නීතිය අනුව සැලකිය යුතු බව ය. මිලිබෑන්ඩ් හා බ්ලේක් ලෝකයට ම හඬගා කියන්නේ ලංකාණ්ඩුව විපක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා අත්අඩංගුවට ගෙන ඇති බව ය. අත්අඩංගුවට ගෙන ඇත්තේ ජනාධිපති අපේක්ෂකයා නොව හිටපු හමුදාපති හා හිටපු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා බව වෙන්කිරීම කුඩාකල සිටම පුරුදු කෙරෙන බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ වැඩුණු බටහිරයෝ හොඳින් ම දනිති. එහෙත් ඔවුහු ඒ බව ලෝකයෙන් සඟවති. ඊනියා මානව හිමිකම් අයිතිකරුවෝ ද අත්අඩංගුවට ගෙන ඇත්තේ හිටපු හමුදා නිලධාරියකු මිස දේශපාලනඥයකු නොවන බව හොඳාකාරව ම දනිති. අවාසනාවකට ලංකාණ්ඩුව ද මේ වෙන්කිරීම ගැන පැහැදිලි අවබෝධයක් මෙරට ජනතාවටවත් නො දෙයි. මෙරට රජයේ ජනමාධ්‍යවලට අරක්ගෙන සිටින පුහු වැඩසටහන් අධ්‍යක්ෂකවරු නිෂ්පාදකවරු නිවේදක නිවේදිකාවෝ තම පුහු පණ්ඩිතකම් පෙන්වමින් ව්‍යාජ වචන අතර සැඟවෙනු හැර සිතා මතා කිසිවක් නො කරති. ඒ අතර මේ ජනමාධ්‍යවලට බලපෑම් කරන කසිකබල් දේශපාලනඥයෝ ද වෙති. ඔවුහු ද තමන්ට නොතේරෙන යමක් ප්‍රකාශකිරීමට හැකි අයට ඒ ජනමාධ්‍යවල දොර වසා තම ව්‍යාජ පාණ්ඩිත්‍යය ආරක්ෂා කරගැනීමට කටයුතු කරති.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වී ඇත්තේ සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගෙන ඇත්තේ දේශපාලන පළිගැනීමක් ලෙස යැයි ඇතැමුන් සිතීම ය. පසුගිය දිනෙක ත්‍රිරෝද රියැදුරකු මගෙන් ඇසුවේ ආණ්ඩුව සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගෙන ඉන්පසු ඔහු කළ වැරදි සොයන බව ඇත්ත ද යන්න ය. සරත් ෆොන්සේකා අදාළ කරුණු සම්බන්ධයෙන් ගත්කල වැරදි කිරීමට පටන්ගත්තේ හමුදාපතිව සිටි කාලයේ දීම බවත් හමුදා පොලීසිය ක්‍රියාකරන ආකාරය සාමාන්‍ය පොලීසිය ක්‍රියාකරන ආකාරයෙන් වෙනස් බවත් පැහැදිලි කෙළෙමි. සරත් ෆොන්සේකා තමා හමුදාපති ව සිටිය දී ම  අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහලේ දී කටමැත දොඩමින් කළ ඊනියා සුදු කොඩි රැගෙන පැමිණි අයට වෙඩි තැබී ය යන ප්‍රකාශයේ සිට අද කරන ප්‍රකාශ දක්වා ඔහුගේ විකාශය අප තේරුම් ගන්නේ කෙසේ ද? ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් කිරීම පසුවට කල්තබා ඉතා කෙටියෙන් කිව හැක්කේ ඇමරිකානුවන් හා බ්‍රිතාන්‍යයන් සරත් ෆොන්සේකාගේ කටමැත දෙඩවීම් ප්‍රයෝජනයට ගෙන ඔහු තම ග්‍රහණයට ගනිමින් ඇමරිකාවේ ග්‍රීන් කාඩ් හිමියකු වූ  ඔහුට ජීවිතදානය පොරොන්දු වී යම් යම් අවශ්‍යතා ඉටුකරගන්නා බව ය. ඒ අවශ්‍යතා අතර මහින්ද රාජපක්ෂ මහතා, ගෝඨාභය රාජපක්ෂ මහතා හා ශවීන්ද්‍ර සිල්වා මහතා වැනි හමුදා නිලධාරීන් ඊනියා ජාත්‍යන්තර යුද්ධාධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා සාක්ෂි දීම ද කොටි පැරදවීමේ ගෞරවය තමාට පමණක් අත්කරගනිමින් ඒ මත පදනම් වී ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම ද වෙයි.

බ්ලේක් හා මිලිබෑන්ඩ් බලා සිටියේ සරත් ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම වැරදි යැයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන තුරු ය. එහෙත් පසුගිය බදාදා ම ශ්‍රේෂ්ඨාධිකරණය සරත් ෆොන්සේකා තවදුරටත් අත් අඩංගුවේ තබාගැනීමට අවසර දුන්නේ ය. එය බටහිරයන්ට මෙන් ම අද ඔවුන්ගේ කුක්කන් වී සිටින සෝමහංස - අනුර දිසානායක කල්ලියට හා රනිල් රවි බටහිර ඒජන්තයන්ටත් වැදුණු පහරක් විය. මෙරට හමුදාවත් ආණ්ඩුවත් වැඩ කරන්නේ රටේ නීතියට අනුව බව දැන් පැහැදිලි ය. එපමණක් නොව මිලිබෑන්ඩ්ට මෙහි දී කටඋත්තරත් නැතිවන්නේ මෙරට හමුදා පනත බ්‍රිතාන්‍ය හමුදා පනත අනුව සකස් කෙරුණක් වීම නිසා ය. අපේ හමුදා පනත අපට අවශ්‍ය අන්දමට වෙනස්කර ගැනීම ඊළඟ පාර්ලිමේන්තුවට භාර ය. හැකි ඉක්මණින් එසේ කළ යුතු යැයි අපි විශ්වාස කරමු. එහෙත් දැනට තිබෙන හමුදා පනත අනුව කටයුතු කිරීම ඊනියා මානව අයිතිවාසිකම් කඩකිරීමක්

© Prof. Nalin De Silva

යැයි බිලේක්ටවත් විශේෂයෙන් ම බ්‍රිතානි විදේශ ඇමති මිලිබෑන්ඩ්ටවත් කිසිසේත් ම කිව නොහැක්කේ ඒ පනත ඔවුන්ගේ ම පනතක් අනුව සකස්කෙරී ඇති බැවිනි.

බිලේක් හා මිලිබෑන්ඩ් ඇතුලු බටහිරයන්ගේ ක්‍රියාකලාපය හඳුනාගැනීමට මෙරට බොහෝ දෙනා අසමත් වී සිටිති. ඔවුන්ගේ ක්‍රියා කලාපය හඳුනා නොගෙන අපට ඔවුන් පරාජය කළ නො හැකි ය. දේශපාලනයේ හෝ භෞතික විද්‍යාවේ හෝ වෙනත් ක්ෂෙත්‍රයක හෝ දැනුම (ප්‍රවාද) නිර්මාණය කිරීම කණා ගල් ගසන්නාක් මෙන් කළ නො හැකි ය. ඇතැමුනට අනුව අද අපට විරුද්ධව බටහිරයන්ගේ කුමන්ත්‍රණයක් වෙයි. එසේ කියන අතර ඇතැම්හු ආරම්භයේ දීත් කොටි පිටුපස බටහිර කුමන්ත්‍රණයක් වූ බව කියති. මෙරට වාමාංශිකයෝ හා ඔවුන් අනුව සිතන්නට පුරුදු වූ ඊනියා බුද්ධිමත්තු එකල කෝකටත් තෛලය මෙන් සී අයි ඒ කුමන්ත්‍රණ ගැන කීමට පුරුදු වී සිටියහ. සී අයි ඒ කුමන්ත්‍රණයක් යන්න පසුකලක බටහිර කුමන්ත්‍රණයක් බවට පත්විණි. එහෙත් යමක් කුමන්ත්‍රණයක් යැයි කී පමණින් කිසිවක් අවබෝධ නොවනවා පමණක් නොව තිස් අවුරුද්දකටත් වැඩි කාලයක් තිස්සේ කෙරෙන කුමන්ත්‍රණය කුමක් ද යන්න ද ප්‍රශ්නයක් වෙයි. බටහිරයන්ගේ ක්‍රියා කලාපය තේරුම් ගැනීමට කුමන්ත්‍රණය යන වචනය යෙදීමට මා විරුද්ධවන්නේ කුමන්ත්‍රණයක් ලෙස ඒ තේරුම්ගැනීම මා විසින් නොව වෙනත් අය විසින් කරන ලද බැවිනි යැයි එක් ඊනියා බුද්ධිමතකු ව්‍යංගයෙන් කියා තිබෙනු මම පසුගියදා දුටුවෙමි. වෙනත් අයගේ අගය කළ යුතු අදහස් අගය කිරීමට මම පසුබට නො වෙමි. උදාහරණයක් ලෙස ගතහොත් පනස්හය යනු අනගාරික ධර්මපාල ව්‍යාපාරයෙහි ම පුනර්ජීවනයකි යනුවෙන් ගුණදාස අමරසේකර මහතා කර ඇති ප්‍රකාශය මම බෙහෙවින් අගය කරමි. එහෙත් බොහෝ දෙනා යම් යම් දේ තේරුම් ගැනීමට උත්සාහ ගන්නේ කණා ගල් ගසන ආකාරයට ය. කුමන්ත්‍රණය ද එවැන්නකි.

මෙරට දෙමළ ජාතිවාදය ආරම්භ වූ ආකාරය හා වැඩි යෑම පිළිබඳව මෙන් ම දෙමළ ජනවර්ගයේ ඉතිහාසය පිළිබඳව ද අපේ ප්‍රවාද වෙයි. ඒ පිළිබඳ ව බොහෝ දේ ලියා ඇති බැවින් නැවතත් ඒ කරුණු කීමට මම බලාපොරොත්තු නො වෙමි. නන්දිකඩාල් කලපුවේ දී දෙමළ ත්‍රස්තවාදය මෙන් ම දෙමළ බෙදුම්වාදය ද පැරදවීමට අපි සමත්වීමු. එහෙත් අවාසනාවකට දෙමළ ජාතිවාදය පැරදී නැත. එයට හේතුව දෙමළ ජාතිවාදය බටහිර යටත්විජිතවාදීන්ගේ නිර්මාණයක් වීම ය. එපමණක් නොව එය පෝෂණය කෙරෙන්නේ ද බටහිරයන් විසිනි. අද ලංකාවේ ද බටහිර රටවල ද දෙමළ ජාතිවාදය බටහිරයන්ගේ ආධාරයෙන් හා අනුග්‍රහයෙන් පවතියි. බිලේක් හා මිලිබෑන්ඩ් වැන්නවුන් අපට විරුද්ධව ක්‍රියාකරන්නේ බටහිර රටවල වාසය කරන දෙමළ ජනයාගේ ඡන්ද බලාගෙන යැයි සිතීම වැරදි ය. බටහිර රටවල වාසය කරන විසිරුණු දෙමළ ජනයා සතුටු කිරීමට මිලිබෑන්ඩ්ලා ක්‍රියා කරනවා නො වේ. විසිරුණු දෙමළ ජනයා අතර (හා මෙරට සම්බන්ධන් වැන්නවුන් හා රාජ්‍ය නොවන සංවිධාන අතර) දෙමළ  ජාතිවාදය පවත්වාගෙන යනු ලබන්නේ බටහිර යටත්විජිතවාදීන් විසිනි. බටහිරයන් අපට විරුද්ධ වන්නේ අපේ ඇතැයි කියන තෙල් ටික බලාගෙන ද නො වේ. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට, ආර්ථිකයට හා දේශපාලනයට අනුගත නොවන රටවල් නැතිකිරීමට බටහිරයෝ කටයුතු කරති. ලංකාවේ දී ඔවුන් ඒ සඳහා යොදාගන්නා ප්‍රධාන අවිය ඔවුන් විසින් ඇති කෙරී පෝෂණය කෙරුණු දෙමළ ජාතිවාදයයි. එහෙත් ඔවුහු ප්‍රසිද්ධියේ ඒ බවක් නො කියති. ඔවුන් අපට හා සෙසු ලෝකයාට පෙන්නීමට තැත්කරන්නේ මෙරට ඊනියා මානව අයිතිවාසිකම් අහෝසි කෙරී ඇත, භාෂණයේ නිදහස නැත, ජනමාධ්‍ය මර්දනය කෙරී ඇත, සරත් ෆොන්සේකා වැනි ඊනියා දේශපාලන විරුද්ධකරුවන් සිරකෙරී ඇත, (නාවික හමුදාවේ උසස් නිලධාරියකුගේ නිල නිවසේ රඳවා තැබීම දෙකේ දෙකේ කූඩුවක සිරකර සිටීමක් ලෙස පෙන්නීමට උත්සාහ කරති), දෙමළ ජනයාගේ ඊනියා සාධාරණ අයිතිවාසිකම් නැතිකර ඇත ආදිය ය. අපට මේ කසිකබල් වූ ද පදනම් රහිත වූ ද චෝදනාවලට නිසි පිළිතුරු ඇත. අපි ඉරිදා දිවයින සහ අයිලන්ඩ් පුවත්පත ඔස්සේ ඒ පිළිතුරු දී ඇත්තෙමු. බටහිරයන් ජී එස් පී සහනය ඉවතකළ පරිදි ඉදිරි කාලයේ දී ආර්ථික සම්බාධක ද පනවනු ඇත. සරත් ෆොන්සේකා තවත් සුකී කෙනකු කිරීමට උත්සාහයක් ඇත.  ඒ සියල්ලට මුහුණ දීමට ආණ්ඩුවටත් ජනතාවටත් හැකි ය. එහෙත් ඒ සඳහා අප කුමන්ත්‍රණ ගැන නොව ප්‍රවාද ගැන කතාකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva